''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
**Online ISSN: 3051-4924**
https://journals.sjp.ac.lk/index.php/pumithiri
**වෙළුම: 2; I කලාපය; 2025 මාර්තු; පිටු: 69-76**

# ස්ත්‍රී පුරුෂ බව මත සිසුන්ගේ ඉගෙනුම් අපේක්ෂණවල පවතින වෙනස්වීම්

**එස්. එස්. ඇල්විටිගල**
මහාමායා බාලිකා විද්‍යාලය, නුගේගොඩ
Sarithaelvitigala21@gmail.com

**සංක්ෂේපය**

අධ්‍යාපනය මානව සම්පත් සංවර්ධනයේ මූලික මෙවලමක් ලෙස ක්‍රියා කරන අතර, අධ්‍යාපනික සහභාගීත්වයේ දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සමාජ ප්‍රගතිය පෝෂණය කිරීමේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙම අධ්‍යයනය මඟින් සිසුන්ගේ ඉගෙනුම් අපේක්ෂණ, විෂය වරණය, වෘත්තීය අපේක්ෂණ සහ එම අපේක්ෂණ සඳහා බලපාන සාධක කෙරෙහි ස්ත්‍රී පුරුෂ බවෙහි බලපෑම අධ්‍යයනය කරන ලදී. අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමට නියැදි සමීක්ෂණ ක්‍රමය භාවිතා කළ අතර කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ රජයේ පාසල්වලට අයත් පිරිමි ළමුන් 237ක් ගැහැනු ළමුන් 150ක් ගුරුවරු 70ක් සහ දෙමාපියන් 200ක් අධ්‍යයන නියැදියට අයත් විය. ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යන දත්ත රැස් කිරීමේ උපකරණ මඟින් ලබා ගත් දත්ත, ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රම භාවිතා කරමින් විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණ අනාවරණයන්ට අනුව ගැහැනු ළමුන් පිරිමි ළමුන්ට වඩා උසස් අධ්‍යාපන කටයුතුවලදී හා ඇගයීම් කටයුතුවල දී ඉහළ අපේක්ෂණ සහිතව කටයුතු කරන බව අනාවරණය වේ. විෂය වරණයේ දී ගැහැනු ළමුන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ෂකඔ) , නිර්මාණ හා යාන්ත්‍රික තාක්ෂණය වැනි විෂයන් තෝරා ගැනීමේ අඩු ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. සිසුන් වෘත්තීය අපේක්ෂණ ඇති කර ගැනීමේ දී ඒ සඳහා ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවයෙහි බලපෑමක් පවතින අතර සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක සාධක ද ඒ සඳහා පසුබිම් වේ. පිරිමි ළමුන් කාර්මික අංශයේ වෘත්තීන් කෙරෙහිත් ගැහැණු ළමුන් සුදු කරපටි වෘත්තීන් කෙරෙහිත් වැඩි නැඹුරුවක් පවතී.වෘත්තීය අපේක්ෂණ පිහිටුවා ගැනීමේ දී පිරිමි ළමුන් ආර්ථික සාධකවලටත් ගැහැනු ළමුන් සමාජ ගරුත්වය වැනි සමාජ සාධක කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයක් ලබා දෙන බව අනාවරණය විය. විශේෂයෙන්, පිරිමි ළමුන් කෙටි කාලීන වෘත්තීය අපේක්ෂා සහිත වේගවත් සාර්ථකත්වයක් අපේක්ෂා කරන අතර, අධ්‍යාපනයේ සාර්ථකත්වය පිළිබඳ අවම විශ්වාසයකින් කටයුතු කිරීමේ ප්‍රවණතාවක් දැක ගත හැකිය. නමුත් ගැහැණු ළමුන් අධ්‍යාපනය සමාජ සංචලතාවයට හේතුවන මාර්ගයක් ලෙස සලකා අධ්‍යාපනය පිළිබඳ වැඩි විශ්වාසයකින් කටයුතු කරන බව අනාවරණය වේ. ගුරු වෘත්තීය ස්ත්‍රීකරණය වීම, පාසල් පද්ධතියෙහි පිරිමි ගුරුවරුන් සීමිත වීම ,පිරිමි ළමුන්ට පාසල්වල පිරිමි ආදර්ශ චරිත :ෂදකැ එදැක* හිඟකම වැනි සාධක පිරිමි ළමයින්ගේ අඩු අපේක්ෂණ කෙරෙහි බලපා ඇත. පවුල් පසුබිම සහ අධ්‍යාපනය පිළිබඳ පවතින සමාජීය සංජානන සිසුන්ගේ අපේක්ෂණ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු කරයි. අධ්‍යාපනයෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව පවතින විෂමතා අවම කිරීම සඳහා සිසුන් තුළ පුළුල් පරාසයක වෘත්තීය අපේක්ෂණ ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල අවශ්‍යතාවය මෙම අධ්‍යයනයෙන් අවධාරණය කෙරේ.

**මුඛ්‍ය පද:** අධ්‍යයන ජයග්‍රහණය, ඉගෙනුම් අපේක්ෂණ, වෘත්තීය අපේක්ෂණ, විෂය වරණය, ස්ත්‍රී පුරුෂ භාවය

## හැඳින්වීම

ජීව පූර්ණත්වය සඳහා ගැහැණියත් පිරිමියාත් සමාන වන අතර එකිනෙකා අභිබවා නැගී නොයන ආකාරයේ සම මානුෂික අයිතින් හිමිකර ගනී. අධ්‍යාපනික කාර්ය සඳහා සෑම අයෙකුටම කිසිම වෙනස්කමකින් තොරව සහභාගී විය යුතු සම අවස්ථා පැවැතිය යුතුය යන්න අධ්‍යාපනයෙහි සම අවස්ථා සංකල්පය තුළින් අර්ථ ගැන්වේ. 2030 අධ්‍යාපනය සඳහා වූ ඉන්චියොන් ප්‍රකාශනයෙහි (Education 2030 Incheon Declaration) අධ්‍යාපන ප්‍රවේශය, අඛණ්ඩ අධ්‍යාපන සහභාගිත්වයේ සහ අධ්‍යාපන ජයග්‍රහණ ආදියේ දී විශාල වශයෙන් ස්ත්‍රී පුරුෂ පරතරයක් දැකගත හැකි බවත් 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පවතින විෂමතා ඉවත්කිරීම අධ්‍යාපනයෙහි තිරසාර සංවර්ධන අරමුණක් ලෙස දක්වන ලදී. අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ස්ත්‍රී පුරුෂ බව මත පදනම්ව අධ්‍යාපන ජයග්‍රහණ හා සම්බන්ධව සාධන විෂමතා

ඇති වේ නම් ඒ සඳහා හේතුවන සාධක පිළිබඳව අධ්‍යයනය කළ යුතු ය. අධ්‍යාපනයේ දී ශිෂ්‍යයකු සතු ඉගෙනුම් අපේක්ෂණවල ප්‍රබලතාව මත අධ්‍යාපනයෙහි සාර්ථකත්වය රැඳී පවතී. අධ්‍යාපනය පිළිබඳ සිසුන්ගේ ඉගෙනුම් අපේක්ෂණ හා ආකල්ප හඳුනා ගැනීමත් ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව අධ්‍යාපනය පිළිබඳව ප්‍රතිජානාත්මක ආකල්ප වර්ධනය කිරීම අධ්‍යාපනයෙන් සාර්ථක වීමට වැදගත් වේ.

රටකට ආර්ථික වශයෙන් සවිමත් වීමට නම් ශ්‍රම බලකායට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම සම දායකත්වය අවශ්‍යය. කාන්තාවන් ඉහළ අධ්‍යාපන සාධනයක් හිමි කර ගැනීමත් පිරිමි එයට සාපේක්ෂව අඩු කාර්යය සාධනයක් දැක්වීමත් නිසා ඔවුන් නිරතවන රැකියාවන් හා ක්ෂේත්‍ර අනුව ශ්‍රම බලකාය තුළ ශ්‍රම දායකත්වයෙහි අසමතුලිතාවයක් ගොඩ නැගේ. Aturupane, Shoja, & Ebenezer (2018) දක්වන්නේ අවිධිමත් ශ්‍රම වෙළඳපොලෙහි මුල් කාලීන රැකියා අවස්ථා පිරිමි ළමුන්ට බහුල වීම නිසා ද්විතික අධ්‍යාපන මට්ටමේ දී ඔවුන් පාසල් හැර යන බවය. පවත්නා අධ්‍යාපන ක්‍රමය තුළ ගැහැණු ළමුන් පිරිමි ළමුන්ට වඩා අධ්‍යාපන සාධනයෙන් ඉදිරියෙන් සිටියද තරඟකාරී ශ්‍රම වෙළඳපොළෙහි කාන්තාවන්ගේ සාර්ථකත්වය අඩු බවය. නූතන ශ්‍රම වෙළඳපොල ප්‍රවණතා, නිදහස් වෙළඳ ආර්ථික ප්‍රතිපත්ති, ගෝලීයකරණය, තොරතුරු තාක්ෂණය භාවිතා කිරීමේ දී දැනුම හැකියාවන් ආදිය ශ්‍රම වෙළඳපොළතුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට බාධා පමුණවයි. ඉගෙනුම් ක්‍රියාවලිය තුළ දී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම අනන්‍යවූ අභියෝග ගැටලු හඳුනාගැනීමෙන් අධ්‍යාපන සැලැසුම්කරණයේ දී එම තත්වයන් අවම කර ගැනීමට හැකි ආකාරයෙන් අධ්‍යාපන සැලසුම් සකස් කර ගැනීමට පර්යේෂන අනාවරණ තුළින් හැකියාව ලැබේ.

**සාහිත්‍ය විමර්ශනය**

අධ්‍යාපන ක්‍රියාවලියේ දී ගැහැණු ළමුන් පිරිමිළමුන්ට වඩා අපේක්ෂණශීලිව කටයුතු කරන බව Aturupane, shoja and Ebenezer (2018), Nuthanp (2007) පර්යේෂණ අනාවරණ අනුව දක්වයි. ශ්‍රී ලංකාවේ ගැහැණු ළමුන් අභිප්‍රේරණශීලී බවින් හා අධිෂ්ඨානශීලී බවින් පිරිමි ළමුන්ට වඩා ඉහළය. එමෙන්ම ගැහැණු ළමුන් අධ්‍යාපනයෙන් ඉහළ යෑමේ අවශ්‍යතාවයකින් යුතුව කටයුතු කරන බව Aturupane, shoja and Ebenezer (2018) දක්වයි. පිරිමි ළමුන්ගේ අධ්‍යාපන අපේක්ෂණ පිළිබඳව සැලකීමේ දී බොහෝ පිරිමි ළමුන් තුළ මුදල් ඉපයීම සඳහා අධ්‍යාපන සාර්ථකත්වයක් අත්‍යවශ්‍යම නොවේය යන ආකල්පයෙන් යුතුව කටයුතු කිරීම දැකිය හැකි විශේෂතාවයකි. රැකියා සෙවීම හා පහසුවෙන්ම රැකියාවට යාමට මාර්ග සෙවීම ආදී ආකල්ප පිරිමි ළමුන් තුළ දැක ගත හැකි බව පර්යේෂකයින් දක්වයි. ඉන්දියාවේ සිදු කරන ලද පර්යේෂණයකින් Nuthanp (2007) දක්වන්නේ පිරිමි ළමුන් ගැහැණු ළමුන්ට වඩා අධ්‍යයන කටයුතු වලදී අනාගතය හා වෘත්තිය ප්‍රායෝගික අපේක්ෂණ සහිතව කටයුතු කරන බවය.

Gutman, sabates and schoon (2012) සිදු කරන ලද පර්යේෂණයකට අනුව දක්වන්නේ බ්‍රිතාන්‍යයේ තරුණ පිරිමි ළමුන් ගැහැණු ළමුන්ට වඩා අනාගත අපේක්ෂණ කෙරෙහි අවිනිශ්චිත බවකින් කටයුතු කරන බවය. ගැහැණු ළමුන් ඔවුන්ගේ අනාගත අධ්‍යාපන අපේක්ෂණ තුළ දී ඔවුන් දැනට පවතින සමාජ ආර්ථික පසුබිමට වඩා ඉහලින් ඔබ්බට යාමට අවශ්‍ය උත්සහයන් දරයි. එමෙන්ම නව යොවුන් වියේ පසුවන ගැහැණු ළමුන් සඳහා උසස් අධ්‍යාපනයේ නියැලීමට පවතින අවශ්‍යතාවය පිරිමි ළමුන්ට වඩා ඉහළය. ගැහැණු ළමුන් පවතින නව අධ්‍යාපන ප්‍රවණතා හා අවස්ථා හමුවේ ඔවුන්ගේ පවුල් පසුබිම, දෙමාපිය අපේක්ෂණ හෝ පවතින පුද්ගලික සමාජ විශ්වාස පිළිබඳව නොසලකා ඉහළ අපේක්ෂණ සහිතව කටයුතු කරන අතර පිරිමි ළමුන්ට ඔවුන්ට පවතින අධ්‍යාපන අවස්ථා පිළිබඳව උනන්දු නොවීම පිරිමි ළමුන්ගේ අධ්‍යාපනයේ අඩු කාර්ය සාධනයට හේතු වී ඇති බව Gutman, sabates and schoon (2012) තවදුරටත් දක්වයි.

ස්ත්‍රී පුරුෂ බව හා විෂය වරණයෙහි වෙනස පිළිබඳව Delaney and Deverux, (2019) දක්වන්නේ පිරිමි ළමුන් ගණිත විෂයන් ආශ්‍රිත විෂයන් වන භෞතික විද්‍යාව, ව්‍යවහාරික විද්‍යාව හා ආර්ථික විෂයන් තෝරා ගන්නා බවත් ගැහැණු ළමුන් වඩාත් තෝරා ගැනීමට කැමැත්තක් දක්වන්නේ භාෂාවන්, කළා, සංගීතය හා ගෘහ ආර්ථික විද්‍යා විෂයන් බවය. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විෂයන් ස්ත්‍රී පුරුෂ බව අනුව වර්ගීකරණය වීම රැකියා වෙළඳපොළ තුළ දී රැකියා ස්ත්‍රී පුරුෂ බව අනුව වර්ගීකරණය වීමට හේතු වේ. මේ නිසා ශ්‍රම වෙළඳපොළ තුළ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශයෙන්ම ලැබිය යුතු සම දායකත්වය අහිමි වී යාමක් සිදු වේ.

අධ්‍යාපන ලෝකයේ STEM ලෙස අර්ථ නිරූපණය කරන ගණිතය, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව,

ගණිතය යන ක්ෂේත්‍රවල දී ගැහැණු ළමුන්ගේ සහභාගිත්වයේ අවම බව ලෝකයේ බොහෝ රටවල්වල දැකිය හැකි ප්‍රවණතාවයකි. පිරිමි ළමුන් බොහෝ දෙනා මෙම ක්ෂේත්‍ර ආශ්‍රිත රැකියා වල නිරත අතර ගැහැණු ළමුන් සම්ප්‍රදායික රැකියාවලටම වැඩි කැමැත්තක් දැක්වීමේ ප්‍රවණතාවයක් පවතියි. ඒ අනුව සිසුන් විෂය වරණයේ දී හා අනාගත රැකියා වරණයේ දී වඩාත් අවධානය යොමු කරන සාධක හඳුනා ගැනීමට ලැබීම මෙම ප්‍රවණතාවලින් මතුවන ගැටලු විසඳීමට ප්‍රයෝජනවත් වේ.

විද්‍යා හා තාක්ෂණික කේෂේත්‍රවල පවතින ස්ත්‍රී පුරුෂ, අසමානතාවය පිළිබඳව අදහස් දක්වන *Cooper* (2006) දක්වන්නේ විද්‍යා, තාක්ෂණ සහ කළාව යන ක්ෂේත්‍ර තුළ දක්ෂ හැකියාව සහිත කාන්තාවන් අහිමි වීමේ තත්වයන්ට එම ක්ෂේත්‍රයන් මුහුණ පා ඇති බවය. මේ හේතුවෙන් තාක්ෂණික ක්ෂේත්‍රවල ස්ත්‍රී පුරුෂ අසමානතාවයක් ගොඩ නැගෙන බවත් වත්මන් නවීන සමාජයන් තුළ ද එම ක්ෂේත්‍රයන් හි දි පිරිමින් කාන්තාවන්ට වඩා ඉදිරියෙන් සිටින බවත්ය. Nagel (2007) ට අනුව දක්වන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ උසස් අධ්‍යාපන විද්‍යාලවලට බඳවා ගන්නා ප්‍රවේශ විභාගය සඳහා 2006 වර්ෂයේදී පරිඝණක තාක්ෂණ සහ සන්නිවේදන විෂය ධාරාව සඳහා ඉදිරිපත් සිසුන්ගෙන් ගැහැණු ළමුන්ගේ සංඛ්‍යාව සියයට එකක් වැනි ප්‍රතිශතයක් බවය. ඒ අනුව පරිඝණක විද්‍යාව , තොරතුරු තාක්ෂණය වැනි තාක්ෂණික විෂයන් තෝරා ගැනීම සඳහා කාන්තා අපේක්ෂණයේ පවතින්නේ අඩු ප්‍රවණතාවයකි.

සිසුන්ගේ ස්ත්‍රී පුරුෂ බව අනුව ඔවුන්ගේ ඉගෙනුම් අපේක්ෂාවන් වෙනස් වන බව විවිධ පර්යේෂණ හරහා පර්යේෂකයින් අනාවරණය කරන අතර ඒ ඒ සඳහා බලපාන සාධක පිළිබඳව ද විවිධ පර්යේෂණ අනාවරණ දක්වයි. Brown (2000) දක්වන්නේ දශක දෙකක කාලයක සිට අධ්‍යාපන පද්ධතිය තුළ කාන්තාවන්ට සමානාත්මතාවය සඳහා වැඩි අවස්ථා හිමි වෙමින් පවතින බවය. මේ නිසා පාසල් තුළ ක්‍රියාත්මක වන වැඩසටහන් තුළින් කාන්තාවන් පිළිබඳව පවතින සමාජ බලාපොරොත්තු සහ ආකල්ප වෙනසකට ලක් වී ඇති බවය. මෙයට සමාන අදහසක් ඉදිරිපත් කරන Machin (2005) දක්වන්නේ අධ්‍යාපන ආයොජනයක් යන සංකල්ප හරහා දෙමාපියන් දරුවන්ගේ අධ්‍යාපනය පවුලේ ප්‍රාග්ධනයක් ලෙස සැලකූ බවය. මේ නිසා කාන්තා අධ්‍යාපනය ඉහළ යෑම සහ එමගින් පවුල්වල කාන්තා අධ්‍යාපනය මානව ප්‍රාග්ධනයක් ලෙස සැලකිය. එමගින් පවුලේ ආදායම් මට්ටම ඉහළ යාමක් සිදු විය. දශක කිහිපයක් තුළ සිදු වූ සමාජ සංස්කෘතික වෙනස තුළින් කාන්තා අධ්‍යාපනය සඳහා දිරිගැන්වීම් ලැබුණු අතර එයින් ශ්‍රම බලකාය සඳහා කාන්තා දායකත්ය හිමි විය. මේ තුළින් පවුලේ මව්වරු දියණියන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා මුදල් වියදම් කිරීම ආයොජනයක් ලෙස සැලකූ අතර ගැහැණු ළමුන් තුළ ඉහළ ඉගෙනුම් අපේක්ෂණ ඇති වීමට මේ කරුණු ඉවහල් වූ බව Machin, (2005) දක්වයි.

Rampino and Tayor, (2013) ට අනුව ගැහණු ළමුන් පිරිමි ළමුන්ට වඩා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අපේක්ෂණ පිළිබඳව ධනාත්මක ආකල්ප වලින් යුක්තය. ගැහැණු ළමුන් දැඩි දෙමාපියන්ගේ අධීක්ෂණයට මෙන්ම පාලනයට යටත් වන අතර ඔවුන් ධනාත්මක අධ්‍යාපන ආකල්ප සහ අභිලාෂයන් හා සමාජය පිළිගත් හැසිරීම්වලට අනුව හැසිරීම් සකස් කර ගන්නා බවය. මේ සඳහා ගැහැණු ළමුන් උදෙසා වූ සමාජානුයෝජනය, ස්ත්‍රී පුරුෂ කාර්යයන් හා සමාජ පාලනය සහ න්‍යායන් හි බලපෑම පවතිනු බව දැක ගත හැකිය. පිරිමි ළමුන්ගේ ඉගෙනුම් අපේක්ෂණයන්ට වඩා ගැහැණු ළමුන්ගේ ඉගෙනුම් අපේක්ෂණ කෙරෙහි ඔවුන්ගේ දෙමාපිය පසුබිමේ බලපෑම වැඩි බව Rampino and Tayor, (2013) දක්වයි.

ශිෂ්‍යයින් සමාජය විසින් නිර්මාණය කර ඇති ස්ත්‍රී පුරුෂ භූමිකා අනුව අනුවර්තන වීම සිදු කරන බවත් ඊට අනුරූපව තම අපේක්ෂණද ගොඩ නගා ගන්නා බව *Fisky*, (2000) දක්වයි. ශිෂ්‍යයින් ස්ත්‍රී පුරුෂ භූමිකාවන් තම පවුල, මාධ්‍ය හරහා මෙන්ම පාසල හරහාද උගනියි. පාසල තුළින් සිසුන්ට දැනුම සම්ප්‍රේෂණය කරන අතර අගනාකම්, ධර්මතා හා සමාජ ආදර්ශයනද ලබා දෙයි. සිසුන් තමන් අත්පත් කරගත් ස්ත්‍රී පුරුෂ භූමිකා අපේක්ෂාව අනුව විෂයන් ඉගෙනීමට කැමැත්තක් දක්වන බවද Fisky (2000) සඳහන් කරයි.

Chambers et. al, (2018) දක්වන්නේ යුනෙස්කෝ සංවිධානයට අනුව පාසල්වල භාවිත කරන ඉගෙනුම් ක්‍රමවලට වඩා පාසල් භාවිත කරන ද්‍රව්‍යවලට ප්‍රබලව ළමා මනසට බලපෑම් කල හැකි බවය. පාසල්වල භාවිත කරන පෙළපොත් මගින් දැනුම පමණක් නොව සමාජ හා දේශපාලන අනන්‍යතාවය හා ලෝකය පිළිබඳ අවබෝධයක් ද සිසුනට ගෙන දෙයි. බ්‍රිතාන්‍යයේ පෙළපොත්වල ඇති චරිතවලින් 87% ක් ම පුරුෂයින් බවත් පෙළපොත්වල පිරිමි සහ ගැහැණු පිළිබඳව පවතින සංකල්ප ඉතා පටු බවත් ය.

Chambers et. al, (2018) දක්වන්නේ රැකියා පිළිබඳ සම්ප්‍රදායික අදහස් කුඩා කාලයේ දී ම දරුවකුගේ මනසෙහි ස්ථිර වන අතර ඔවුන්ගේ යෞවන කාලය දක්වාම එය ක්‍රියාත්මක වන බවය. අවුරුදු හතරෙහි සහ දහහතරෙහි වයස් කාණ්ඩ දෙක පසුවන ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම අයත් ළමුන්ට රැකියා තේරීම සඳහා කරන ලද ක්‍රියාකාරකමකින් වයස් කාණ්ඩ දෙකටම අයත් ළමුන්ගේ තේරීම බොහෝ දුරට සමාන විය. කුඩා කාලයේ සිටම ආරම්භ වන මෙම සම්ප්‍රදායික හා අවිඥානික වර්ගීකරණය සිසුන්ගේ අධ්‍යාපන අපේක්ෂණ හා රැකියා අපේක්ෂණ සඳහා බලපෑම් කරන බව මෙම පර්යේෂකයින් දක්වයි.

ජයසූරිය (2006) දක්වන්නේ ස්ත්‍රී පුරුෂ වශයෙන් දක්නට ලැබෙන සාධන විෂමතා හා ඉගෙනුම් අපේක්ෂණවල වෙනසට පාසල් පද්ධතිය තුළ පිරිමි ගුරුවරුන්ගේ අඩු බව බලපාන බවය. ජයසූරිය දක්වනුයේ පර්යේෂණයෙන් අධ්‍යයනයට භාජනය වූ සෑම පාසලකම පන්ති භාරකාරිත්වය ද, අංශ ප්‍රධානින් වූයේ ගුරු මහත්මීන් බවය. මෙය පිරිමි ළමුන්ගේ අඩු කාර්යය සාධනය මත පදනම් වූ ඉගෙනුම් අපේක්ෂණ කෙරෙහිද බලපෑමක් සිදු කරන බවය. පාසල් පද්ධතියෙහි පිරිමි චරිත නිරූපණයෙහි පවතින අඩු බව පිරිමි ළමුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට බලපාන බව Mazjub and Rais, (2010) ද පර්යේෂණ තොරතුරු අනාවරණය කරයි. සිසුන්ට දක්නට ලැබෙන ආදර්ශ චරිත (Rolle Model) ළමුන්ගේ ඉගෙනුම් අපේක්ෂණ සහ අධ්‍යාපන ජයග්‍රහණ හා බැඳී පවතින බව Frotman (2018) දක්වයි. ආදර්ශ චරිතවල බලපෑම පිරිමි ළමුන් කෙරෙහි ගැහැණු ළමුන්ට වඩා ඉහළ බලපෑමක් සිදු කරන බව Frotman (2018) පර්යේෂණ තොරතුරු අනාවරණය කරයි.

**පර්යේෂණ ක්‍රමවේදය**


සිසුන් ඉගෙනුම් අපේක්ෂණ ඇති කර ගැනීමේ දී ස්ත්‍රී පුරුෂ බවෙහි බලපෑමේ ස්වභාවය, ස්ත්‍රී පුරුෂ බව අනුව සිසුන්ගේ විෂය වරණයෙහි පවතින වෙනස්කම්, අනාගත රැකියා අපේක්ෂණ ඇති කර ගැනීමේ දී සිසුන්ගේ ස්ත්‍රී පුරුෂ බවෙහි බලපෑම හා ස්ත්‍රී පුරුෂ බව අනුව සිසුන්ගේ ඉගෙනුම් අපේක්ෂණ කෙරෙහි බලපාන සාධක යන පර්යේෂණ අරමුණු ඔස්සේ මෙම පර්යේෂණය මෙහෙය වන ලදී.පර්යේෂණ සංගහනය වනුයේ කොළඹ දිස්ත්‍රික්කයෙහි රජයේ පාසල්වල ඉගෙනුම ලබන පිරිමි ළමුන් හා ගැහැණු ළමුන් වන අතර අධ්‍යයන ජනගහනය වනුයේ කොළඹ දිස්ත්‍රික්කයෙහි ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයෙහි රජයේ පාසල්වල ඉගෙනුම ලබන පිරිමි ළමුන් හා ගැහැණු ළමුන් ය. අහඹු ස්තරායන පොකුරු නියැදි ක්‍රමයට අනුව තෝරා ගත් පර්යේෂනය නියැදියට 11 ශ්‍රේණියෙහි අධ්‍යපනය ලබන පිරිමි ළමුන් 237 ක් ගැහැනු ළමුන් 150 ක් ද ගුරුවරුන් 70 ක් සහ දෙමාපියන් 200 අයත් විය.පර්යේෂණයට අවශ්‍ය දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා යන දත්ත රැස් කිරීමේ උපකරණ භාවිත කරන ලදී. වගු , ප්‍රතිශත හා ප්‍රස්තාර යන විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පිය ක්‍රම යොදාගනිමින් දත්ත ඉදිරිපත් කර ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණයන් හා අවශ්‍ය ස්ථානවලදී ගුණාත්මක දත්ත විශ්ලේෂණයන් ද දත්ත විශ්ලේෂණයේ දි යොදා ගන්නා ලදී.

**පර්යේෂණ අනාවරණ**

සිසුන් ඉහළ ඉගෙනුම් අපේක්ෂණ සහිතව අධ්‍යයන කටයුතුවල නියැලීමෙන් සාර්ථක අධ්‍යාපන ජයග්‍රහණ කරා ළඟා විය හැක. ඉගෙනුම් ක්‍රියාවලිය තුළ දී සිසුන්ගේ ඉගෙනුම් අපේක්ෂණවල ස්වභාවය අපේක්ෂණවල පවතින ප්‍රබල බව ඔවුන්ගේ ඉගෙනුම් සාර්ථකත්වයට සෘජු බලපෑමක් සිදු කරයි. එමෙන්ම සිසුන්ට ඉගෙනුම් අපේක්ෂණ ගොඩ නගා ගැනීමට හේතුවන සාධක ද පවති. මෙම අධ්‍යයනයෙන් සිසුන්ගේ ඉගෙනුම් අපේක්ෂණවල ස්වභාවය, ඉගෙනුම් අපේක්ෂණ සඳහා විෂය වරණය, අනාගත රැකියා අපේක්ෂණ සහ ඉගෙනුම් අපේක්ෂණ සඳහා බලපාන සාධක සිසුන්ගේ ස්ත්‍රී පුරුෂ බව අනුව වෙනස් වන්නේ ද යන්න අධ්‍යයනය කරන ලදී.


ඉගෙනුම් ක්‍රියාවලිය තුළ සාර්ථක ප්‍රතිඵල අත් කර ගැනීම සඳහා සිසුන්ගේ පවතින අපේක්ෂණවල ස්වභාවය පර්යේෂණ නියැදියට අනුව අධ්‍යයනය කරන ලදී. එහිදී අධ්‍යයනය නියැදියෙහි 11 ශ්‍රේණියේ සිසුන් මුහුණ දෙන ජාතික තලයේ විභාගයක් වන අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී ලබා ගැනීමට අපේක්ෂා කරන ප්‍රතිඵල සම්බන්ධව ඔවුන්ගේ පවතින අපේක්ෂණ පිළිබඳ ශිෂ්‍ය ප්‍රශ්නාවලිය තුළින් ද විමසා බලන ලදී. ඒ සඳහා සිසුන් ලබා දුන් ප්‍රතිචාර ප්‍රස්තාර අංක 1ට අනුව අ.පො.ස. සා.පෙළ විභාගය තුළ විශිෂ්ඨ සාමාර්ථ ලබා ගැනීම හා විභාගය සමත් වීමපිළිබවඳ ගැහැණු ළමුන්ගේ අපේක්ෂණ පිරිමි ළමුන්ට වඩා ඉහළය.

රූපය 1: අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ සිසු අපේක්‍ෂණ ස්ත්‍රී පුරුෂ බව අනුව




මූලාශ්‍රය: ඇල්විටිගල,. 2020, පි.169

රූපය 2: අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් පසු සිසු අනාගත අපේක්‍ෂණ




මූලාශ්‍රය: ඇල්විටිගල, 2020, පි.171

අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් පසුව සිසුන්ගේ පවතින අනාගත අපේක්‍ෂණ පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් පසු සිසුන් තවදුරටත් අධ්‍යාපන කටයුතු වන නිරතවේ ද නැතිනම් ශ්‍රම වෙළඳපොළ කරා යොමුවේද යන්න මෙහිදී විමසා බැලුණි. ශිෂ්‍ය ප්‍රශ්නාවලිය තුළින් ඒ සඳහා ලද ප්‍රතිචාර ප්‍රස්ථාර අංක 02 දක්වා ඇත.ප්‍රස්ථාර අංක 02ට අනුව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් පසු අ.පො.ස. (උ.පෙළ) හැදෑරීමට බලාපොරොත්තු වන බව නියැදියෙහි සිසුන්ගේ බහුතරයගේ මතය විය. අ.පො.ස. උසස් පෙළ හැදෑරීමට බලාපොරොත්තු වේයැයි ප්‍රතිචාර දක් වූ සිසුන්ගෙන් ගැහැණු ළමුන්ගේ 81.2% කි. පිරිමි ළමුන්ගෙන් 55.7% ක් අ.පො.ස. සාමාන්‍ය පෙළ පසුව අ.පො.ස. උසස් පෙළ හැදෑරීමට බලාපොරොත්තු වන බවට ප්‍රතිචාර දක්වා ඇත.පර්යේෂණ නියැදියෙහි සිසුන්ගෙන් පිරිමි ළමුන්ට වඩා ගැහැණු ළමුන් ඉදිරි උසස් අධ්‍යාපන කටයුතුවල නිරත වීමේ වැඩි අපේක්‍ෂණයකින් යුතුව කටයුතු කරන බව අනාවරණය විය. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා යොමු නොවී රැකියාවක නියුතු වීම සිය අපේක්‍ෂාව බවට ප්‍රතිචාර දක් වූ පිරිසෙහි බහුතරය පිරිමි ළමුන්ය.ඒ අනුව පිරිමි ළමුන් ගැහැණු ළමුන්ටය වඩා ඉතා ඉක්මනින් රැකියාවක නියැලීමට ශ්‍රම වෙළෙඳපොළට ප්‍රවේශ වීමේ අපේක්‍ෂාවන් සහිතව කටයුතු කරන බව අනාවරණය විය. Aturupane, Shoja & Ebenezer (2018) මෙයට සමාන පර්යේෂණ අනාවරණයකින් දක්වන්නේ අවිධිමත් ශ්‍රම වෙළඳපොළෙහි මුල් කාලීන රැකියා අවස්ථා පිරිමි ළමුන්ට බහුල වීම පිරිමි ළමුන් ද්විතිකඅධ්‍යාපන මට්ටමේදී පාසල් හැරයාමට හේතු වන බවය.

පාසල් අධ්‍යාපනයේ දී ජ්‍යෙෂ්ඨ ද්විතික ශ්‍රේණිවල දී සිසුන්ට විෂය තෝරා ගැනීමට අවස්ථාව ලැබෙන කාණ්ඩ විෂයන් වරණයේ දී පිරිමි ළමුන් තුළ ව්‍යාපාර හා ගිණුම්කරණය, චිත්‍ර, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය තොරතුරු සන්නිවේදන තාක්ෂණය වැනි විෂයන් ජනප්‍රියම විෂයන් වේ. ගැහැණු ළමුන් කාණ්ඩ විෂයන් වරණයේ දී භූගෝල විද්‍යාව, නැටුම්, ගෘහ ආර්ථික විද්‍යාව වැනි විෂයන් කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්වයි. ස්ත්‍රී පුරුෂ බව අනුව සිසුන්ගේ විෂයවරණය කෙරෙහි පවතින නැඹුරුතාවය පිළිබඳ පර්යේෂණ අනාවරණ Brown (2000), සහ Delaney and Deverux(2019) පර්යේෂණ අනාවරණයන්වලට සමාන අදහස් ඉදිරිපත් කරයි. සිසුන්ගේ අපේක්‍ෂණ හා විෂයයන් වරණය කෙරෙහි දෙමාපියන්ට වඩා සම වයස් කණ්ඩායම්වල මිතුරන්ගෙන් සිදුවන බලපෑම බව ප්‍රබල බව අනාවරණය විය. පිරිමි ළමුන්ට වඩා ගැහැණු ළමුන් සම වයස් කණ්ඩායම්වල බලපෑම මත අපේක්ෂණ හා වරණයන් සිදු කරන බවත් පිරිමි ළමුන් විෂය වරණයේ දී විෂයන්වල ස්වභාවය, එම විෂයන් වඩාත් පහසු වීම, පාසලෙන් සීමිත විෂයන් සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීම, විෂය උගන්වන ගුරුවරයා යන සාධක මත විෂය වරණය සිදු කරන බව පර්යේෂණ අනාවරණ දක්වයි.

සිසුන්ගේ අනාගත රැකියා අපේක්ෂණ හා වරණයන්හි දී ස්ත්‍රී පුරුෂ බව අනුව වෙනස් වීමේ ස්වරූපයක් පවතින බව අධ්‍යයන නියැදිය අනුව පර්යේෂණ අනාවරණ දක්වයි. වගු අංක 01ට අනුව ව්‍යාපාරික,ආරක්‍ෂක,ඉංජිනේරු හා කාර්මික ක්ෂේත්‍ර කෙරෙහි පිරිමි ළමුන් වැඩි රුචිකත්වයක් දක්වන අතර ගුරු ,වෛද්‍ය, නීතිඥ,ගණකාධිකාරී /වාණිජ්‍ය හා රූපලාවන්‍යක්ෂේත්‍ර කෙරෙහි ගැහැණු ළමුන් වැඩි

රුචිකත්වයක් දක්වයි. ඉංජිනේරු හා කාර්මික ක්ෂේත්‍ර කරා යොමු වීමේ දී පිරිමි ළමුන් ඒ සඳහා වැඩි රුචිකත්වයක් දක්වන බවට අනාවරණය විය.

ගැහැණු ළමුන් සමාජය විසින් පිළිගත් සුදු කරපටි රැකියා කෙරෙහි වැඩි විශ්වාසයෙන් යුතුව එම ක්ෂේත්‍රයන්ට අදාළ රැකියා කෙරෙහි සිය අපේක්ෂණ ගොඩ නගා ගන්නා බව පෙනී යයි. Cooper (2006) විද්‍යා හා තාක්‍ෂණික ක්ෂේත්‍රවල පවතින ස්ත්‍රී පුරුෂ අසමානතාව නිසා දක්ෂ හැකියා සහිත කාන්තාවන් එම ක්ෂේත්‍රවලට අහිමි වීමේ තත්වයට එම ක්ෂේත්‍ර මුහුණ දී ඇති බවත් මේ හේතුවෙන් තාක්‍ෂණික ක්ෂේත්‍රවල ස්ත්‍රී පුරුෂ අසමානතාවයක් ගොඩනැගෙන බවත් දක්වන පර්යේෂණ අනාවරණ හා මෙම පර් යේෂණ අනාවරණ සැසඳේ. සිසුන් රැකියා වරණය හා අපේක්‍ෂණවල දී ස්ත්‍රී පුරුෂ වෙනස මත පදනම් ව රැකියා අපේක්ෂණ ඇති කර ගන්නා බව අනාවරණය වේ. ඒ සඳහා සිසුන් තුළ කුඩා කාලයේ සිටම ගොඩනැගුණ ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ මනෝවිද්‍යාත්මක පසුබිම් තත්වයන් හා සමාජ විද්‍යාත්මක පසුබිම් සිසුන්ගේ රැකියා අපේක්‍ෂණ කෙරෙහි බලපෑ හැකිය.


වගුව 1: සිසුන්ගේ රැකියා අපේක්‍ෂණ

| රැකියා ක්‍ෂේත්‍ර | පිරිමි ළමුන් | | ගැහැණු ළමුන් | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ව්‍යාපාරික | 37 | 15.7 | - | - |
| ඉංජිනේරු | 30 | 12.9 | 02- | -1.4 |
| කාර්මික | 27 | 11.4 | - | - |
| ගෘහ නිර්මාණ | 03 | 1.4 | - | - |
| ආරක්‍ෂක | 41 | 17.1 | 09 | 5.7 |
| ක්‍රීඩා | 07 | 2.9 | - | - |
| වෛද්‍ය | 07 | 2.9 | 15 | 10 |
| මාධ්‍ය | 10 | 4.3 | 06 | 4.3 |
| සූපවේදී | 10 | 4.3 | - | - |
| ගණකාධිකාරී /වාණිජ්‍ය | 10 | 4.3 | 13 | 8.6 |
| බැංකු | 14 | 5.7 | 11 | 7.1 |
| පරිගණක | 10 | 4.3 | 11 | 7.1 |
| ගුරු | 3 | 1.4 | 47 | 31.4 |
| හෙද | - | - | 02 | 1.4 |
| රූපලාවන්‍ය | - | - | 13 | 8.6 |
| නීතිඥ | - | - | 13 | 8.6 |
| වෙනත් | - | - | 09 | 5.7 |
| නිශ්චිත රැකියා අපේක්‍ෂණ නැත. | 27 | 11.4 | 09 | 5.7 |
| එකතුව | 237 | 100 | 150 | 100 |

මූලාශ්‍රයඃ ඇල්විටිගල, 2020 පි.176

අනාගත රැකියා අපේක්‍ෂණ සඳහා බලපාන සාධක පිළිබඳව ප්‍රස්තාර අංක 03 ට අනුව රැකියාවක් තෝරා ගැනීමේ දී පිරිමි ළමුන් ගැහැණු ළමුන්ට වඩා ආර්ථික හැකියාව යන සාධකයට වැදගත්කමක් ලබාදෙයි.සමාජ තත්වය හා ස්ත්‍රී පුරුෂ බවට ගැලපේ ද යන සාධකය කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්වා තම රැකියා අපේක්ෂණ ඇති කර ගැනීමට ගැහැණු ළමුන් කටයුතු කරන බව අනාවරණය වේ. අනාගත රැකියා අපේක්ෂණ ඇති කර ගැනීමේ දී දෙමාපිය කැමැත්ත යන සාධකය ගැහැණු ළමුන්ටත් සම මිතුරු කණ්ඩායම්වල බලපෑම පිරිමි ළමුන්ටත් වැඩි වශයෙන් බලපාන බව පර්යේෂණ අනාවරණ අනුව දැක්විය හැකිය.

රූපය 3: සිසුන්ගේ රැකියා වරණයෙහි අපේක්‍ෂණ සඳහා බලපාන සාධක




මූලාශ්‍රයඃ ඇල්විටිගල, 2020 පි.178

සිසුන්ගේ ඉහළ ඉගෙනුම් අපේක්‍ෂණ කෙරෙහි අධ්‍යාපනයෙහි අවශ්‍යතාවය පිළිබඳව සිසුන් තුළ පවතින ආකල්පය වැදගත්ය. පිරිමි ළමුන් අධ්‍යාපනය පිළිබඳ වැඩි විශ්වාසයකින් තොරව කෙටි අපේක්‍ෂණ සහිතව කටයුතු කරන බවත් ගැහැණු ළමුන් ඔවුන් තුළ ඉහල ඉගෙනුම් අපේක්‍ෂණ පවත්වාගෙන යෑම සඳහා අධ්‍යාපනයෙහි වැදගත්කම පිළිබඳව අවබෝධයකින් යුතුව කටයුතු කරන බව පර්යේෂණය අනුව අනාවරණය වේ. . ආදර්ශ චරිත මෙන්ම සමාජ ආර්ථික වටපිටාව අනුව ද සිසුන්ගේ අපේක්‍ෂණ ගොඩ නැගේ. පර්යේෂණ නියැදිය සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවන් හි දී සමාජය හා පාසල් පද්ධතිය තුළ ආදර්ශ චරිත පිළිබඳව පවතින හිඟතාවය සහ ඒ පිළිබඳ හඳුනා නොගැනීම පිරිමි ළමුනගේ අපේක්‍ෂණ කෙරෙහි වඩාත් බලපෑමක් සිදු කරන බව අනාවරණය විය.ගුරු වෘත්තියෙහි පිරිමි ගුරුවරුන්ගේ පවතින අඩු බව මෙන්ම අධ්‍යාපනයෙන් ඉහළ තලවල සිටින පුරුෂ චරිත

පිරිමි ළමුනට හඳුනා ගැනීමට නොහැකි වීම වැනි හේතුන් පිරිමි ළමුන්ගේ අධ්‍යාපන ක්‍රියාවලියට මෙන්ම අපේක්ෂණ කෙරෙහි බලපාන බව දැක්විය හැක. සමාජය තුළ අධ්‍යාපනයේ පවතින ගැටලුකාරී තත්වයන්ට අධ්‍යාපනය පිළිබඳ පවතින සමාජ ආකල්ප ආදිය ද ගැහැණු ළමුන්ට වඩා පිරිමි ළමුන්ගේ ඉගෙනුම් අපේක්ෂණ කෙරෙහි බලපාන බව පර්යේෂණ අනාවරණයන් දක්වයි.

**නිගමන**

අධ්‍යාපනය සම්බන්ධව පවතින ඉහළ අපේක්ෂණ අධ්‍යාපන සාර්ථකත්වය සඳහා හේතු වේ. විභාග සමත් වීම හා විශිෂ්ඨ සාමාර්ථ ලබා ගැනිම කෙරෙහි ගැහැණු ළමුන්ගේ පවතින අපේක්ෂණ පිරිමි ළමුන් ට සාපේක්ෂව ඉහළ බව නිගමනය කළ හැකිය. Nuthanp (2007), Aturupane, Shoja, & Ebenezer (2018) පර්යේෂන අනාවරණ මෙම නිගමනය හා සැසඳේ. ඉදිරි උසස් අධ්‍යාපන කටයුතුවල නිරත වීමේ වැඩි අපේක්ෂණයකින් යුතුව කටයුතු කරන්නේ පිරිමි ළමුන් ට වඩා ගැහැණු ළමුන් ය. පිරිමි ළමුන් ගැහැණු ළමුන්ට සාපේක්ෂව අධ්‍යාපන කටයුතු ඉතා ඉක්මනින් නිම කර රැකියාවක නියැලීමට ශ්‍රම වෙළඳපොළට ප්‍රවේශ වීමේ අපේක්ෂාවන් සහිතව කටයුතු කරන බව පර්යේෂණ නිගමන දක්වයි. සිසුන්ගේ විෂය වරණයේ දී භාෂාව හා සාහිත්‍ය රසාස්වාදය ආශ්‍රිත විෂයන් තෝරා ගැනීම සඳහා පිරිමි ළමුන් දක්වන්නේ අඩු රුචිකත්වයකි. එසේම තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය, නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය වැනි විෂයන් තෝරා ගැනීම කෙරෙහි ද ගැහැණු ළමුන්ගේ පවතින්නේ ද අඩු ප්‍රවණතාවයකි. සිසුන්ට විෂය වරණයේ දී විෂයට ඇති කැමැත්ත, සම වයස් මිතුරු කණ්ඩායම් වල බලපෑම ආදී සාධක මත පදනම්ව විෂය වරණය සිදු කරන බව දක්නට ලැබේ. පිරිමි ළමුන් විෂයෙහි ස්වභාවය විෂය උගන්වන ගුරුවරයාගේ ස්වභාවය ආදිය කරුණු පිළිබඳව විෂය වරණයේ දී සැලකිලිමත් වේ. සිසුන්ගේ රැකියා අපේක්ෂණයන්හි දී පිරිමි ළමුන් ව්‍යාපාරික, ආරක්‍ෂක, ඉංජිනේරු හා කාර්මික ක්ෂේත්‍රයන්හි රැකියා සඳහා වැඩි කැමැත්තක් දක්වන බවත් ගැහැණු ළමුන්ගේ රැකියා අපේක්ෂණයන්හි ජනප්‍රිය වෘත්තිය ගුරු වෘත්තිය ලෙසත් පර්යේෂණ තොරතුරුවලට අනුව නිගමනය වේ. පර්යේෂණ තොරතුරු අනුව පිරිමි ළමුන් කාර්මික ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියාවල නිරත වීමටත් ගැහැණු ළමුන් සමාජය පිළිගත් සුදු කරපටි රැකියා කෙරහි වැඩි විශ්වාසයකින් යුතුව අපේක්ෂණ ගොඩ නගාගෙන ඇති බවත් නිගමනය කළ හැකි විය. සිසුන්ගේ රැකියා වරණය හා අනාගත අපේක්ෂණයන්හි දී ස්ත්‍රී පුරුෂ වෙනස මත පදනම්ව රැකියා අපේක්‍ෂණ පවත්වා ගන්නා බව දැකිය හැකිය. සිසුන් තුළ කුඩා කල සිටම ගොඩනැගුණු ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ මනෝ විද්‍යාත්මක පසුබිම් හා සමාජ විද්‍යාත්මක පසුබිම් වල බලපෑම රැකියා වර්ණයේ දී හා අනාගත අපේක්‍ෂණ කෙරෙහි අවිඥානික අයුරින් බලපා ඇති බව පර්යේෂණ තොරතුරු අනුව නිගමනය කළ හැකිය. පිරිමි ළමුන් රැකියා අපේක්‍ෂණ ඇති කර ගැනීමේ දී ආර්ථිකය යන සාධකයට වැඩි ප්‍රමුඛත්වයක් ලබාදෙන බවත් ගැහැණු ළමුන්ගේ වැඩි අවධානයක් යොමු කරන්නේ සමාජ තත්වය යන සාධක කෙරෙහි බවත් අනාවරණය විය. ගැහැණු ළමුන්ගේ රැකියා අපේක්‍ෂණ කෙරෙහි දෙමාපිය කැමැත්තෙහි බලපෑමක් පවතින බවත් පිරිමි ළමුන් රැකියා අපේක්‍ෂණ ගොඩ නගා ගැනීමේදී සම වයස් කණ්ඩායම් වල බලපෑම පවතින බවත් පර්යේෂණ තොරතුරු අනුව නිගමනය කළ හැකිය.අනාගත අපේක්‍ෂණ සම්බන්ධව පිරිමි ළමුන් තුල ඇත්තේ කෙටි අපේක්‍ෂණ ය. අනාගත අපේක්‍ෂණ ඉටු කර ගැනීමේ දී අධ්‍යාපනය පිළිබඳ විශ්වාසයකින් තොරව කෙටි ක්‍රම මගින් අපේක්‍ෂණ ඉටුකර ගැනීමේ ස්වභාවය පිරිමි ළමුන් තුළ පවතින බව පර්යේෂන අනාවරණ දක්වයි. ගැහැණු ළමුන් අධ්‍යාපනය සමාජ සචලතාවයට හේතුවක් ලෙස සලකා අධ්‍යාපනය පිළිබඳ විශ්වාසයකින් ඉගෙනුම් කටයුතුවල නිරත වේ යන පර්යේෂණ අනාවරණය *Gutman, sabates and schoon* (2012) පර්යේෂණ අනාවරණ හා සැසඳේ. පාසල් පද්ධතිය තුළ ආදර්ශ චරිත පිළිබඳ පවතින හිඟතාවය සහ ඒ පිළිබඳව පවතින අඩු අවබෝධය පිරිමි ළමුන්ගේ අපේක්‍ෂණ කෙරහි බලපෑමක් සිදු කරන බව නිගමනය කළ හැකි විය. Frotman, (2018) පර්යේෂණ අනාවරණයකින් මේ හා සමාන අනාවරණයක් ඉදිරිපත් කරයි. එමෙන්ම පාසල්වල පිරිමි ගුරුවරුන්ගේ අඩු බව , පාසල් ස්ත්‍රීකරණය වීම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ තලවල සිටින පුරුෂ චරිත සිසුන් හඳුනා නොගැනීම, සමාජ තුළ අධ්‍යාපනයේ පවතින ගැටලුකාරී තත්වයය, පවුල් පරිසරය ආදී සාධක ගැහැණු ළමුන්ට වඩා පිරිමි ළමුන්ගේ අපේක්‍ෂණ කෙරෙහි බලපාන බව පර්යේෂණ තොරතුරු අනුව නිගමනය කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ඇල්විටිගල, එස්.(2020),ස්ත්‍රී පුරුෂ බව මත සාධන විෂමතා ඇති වීමට ඉගෙනුම් ක්‍රියාවලිය බලපාන ආකාරයඃ අධ්‍යාපන උපාධි නිබන්ධනය,කොළඹ විශ්ව විද්‍යාලය.

ජයසූරිය, ජී.ඩබ්.එස්.එම්. (2006), හතරවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ භාෂා සාධන විෂමතා පිළිබඳ

විමර්ශනාත්මක අධ්‍යයනයක් : අධ්‍යාපනපති උපාධි නිබන්ධය, කොළඹ විශ්වවිද්‍යාලය.

Aturupane, H., & Ebenezer, R. (2017). Sri Lanka: When girls outpace boys in schools. https://blogs.worldbank.org/education/sri-lanka-when-girls-outpace-boys-schools.

Aturupane, H., Shoja, M., & Ebenezer, R. (2018).Gender Dimensions of Educational Access and Achievement in Sri Lanka. https://www.researchgate.net/publication/328751365_Gender_Dimensions_of_Education_Access_and_Achievement_in_Sri_Lanka.

Brown, L. (2000). Gender differences in mathematics performance : Examining affective factors. https://www.researchgate.net/publication/285943823_Gender_differences_in_mathematics_performance_in_Trinidad_and_Tobago_Examining_affective_factors

Cooper, J. (2006). The digital divide: the special case of gender. Journal Of Computer Assisted Learning, 22(5), 320-334. doi: 10.1111/j.1365-2729.2006.00185.x

Delaney, J., & Devereux, P. (2019). It's Not Just for Boys! Understanding Gender Differences in STEM. https://www.iza.org/publications/dp/12176/its-not-just-for-boys-understanding-gender-differences-in-stem

Fiske, E. (2000). Education for All: Status and Trends, 2000. Assessing Learning Achievement..https://www.semanticscholar.org/paper/Education-for-All%3A-Status-and-Trends%2C-2000.-Fiske/4234b0a7695ac06665849832ff31b90d52e6f565

Fortmann, R. (2018). Essays on the Economics of Education and Development (Doctor of Philosophy in Economics). Nova School of Business and Economics Universidade Nova de Lisboa.

Gutman, L., Sabates, R., & Schoon, I. (2014). Uncertainty in educational and career aspirations: Gender differences in young peopleâ€™. Journal Of Vocational Behavior, 80(3), 608-618. doi: 10.1016/j.jvb.2012.02.002

Machin, S., & McNally', S. (2005).Gender and Student Achievement in English Schools.Oxford Review Of Economic Policy, 21(3), 357-372. doi: 10.1093/oxrep/gri021

Majzub, R., & Rais, M. (2010). Boysâ€™ Underachievement: Male versus Female Teachers. Procedia - Social And Behavioral Sciences, 7, 685-690. doi: 10.1016/j.sbspro.2010.10.093

Nagel, D. (2007). Women Lose Ground in IT, Computer Science -- THE Journal. https://thejournal.com/articles/2007/11/06/women-lose-ground-in-it-computer-science.aspx

Nuthanap, P. (2007). Gender analysis of academic achievement among high school students (Degree of Master of Home Science in Human Devlopment).University of Agricultural Science Dharwad.

Rampino, T., & Taylor, M. (2013).Gender differences in educational aspirations and attitudes.Institute For Social And Economic Research ISER Working Paper Series, 2013-15. Retrieved from https://ideas.repec.org/p/ese/iserwp/2013-15.html.